## විශේෂ සටහන 11

## සමානුපාතිකත්වය: නියාමනයන්, බලපත්‍රලාභී බැංකුවල ව්‍යාපාර ආකෘතීන් සමග අනුගත කිරීම

### නියාමන ප්‍රතිපත්තීන් සකස්කිරීමේ දී බැංකුවල ව්‍යාපාර ආකෘතීන් ගේ පවතින වෙනස්කම් පිළිබඳ සැලකිල්ලට ගැනීමේ වැදගත්කම

2007/08 කාල සීමාවේ පැවැති ගෝලීය මූල්‍ය අර්බුදයෙන් පසුව ලොව පුරා මූල්‍ය ක්ෂේත්‍ර නියාමකයන් විසින් වඩාත් සංකීර්ණ සහ තදබල නියාමන පටිපාටි ක්‍රියාවට නැංවීමට පටන්ගත් අතර, මේ හා සමගාමීව, බැංකු අධීක්ෂණය සඳහා වන බාසල් කමිටුව විසින් ගෝලීය වශයෙන් පද්ධතික වැදගත්කමක් ඇති බැංකු ඇතුළුව, අන්තර්ජාතිකව ක්‍රියාකාරී විශාල බැංකුවල අවදානම් අවම කරවීම සඳහා බාසල් III නියාමන රාමුව හඳුන්වා දෙනු ලැබිණ. එසේ වුවත් රටවල් ගණනාවක් විසින් විශාල පරාසයක බැංකු සඳහා මෙම බාසල් සම්මුතීන් ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.

මෙම බාසල් III සම්මුතීන්ගේ සම්පත් අධිභාවිතාව හා සංකීර්ණතාව සැලකිල්ලට ගනිමින්, ගෝලීය වශයෙන් පද්ධතික වැදගත්කමක් ඇති බැංකු නොවන, සංකීර්ණ නොවූ කුඩා බැංකු සඳහා යොදාගැනීමේ දී එම නියාමනයන් ප්‍රශස්ත කිරීමේ අවශ්‍යතාව පිළිබඳ විවාදයක් පැනනැඟුණ අතර මේ හරහා සංකීර්ණ නොවන කුඩා මූල්‍ය ආයතන සඳහා සරල වූ නියාමනයන් ක්‍රියාවට නැංවීමේ අරමුණින් බැංකු ක්ෂේත්‍රයට හඳුන්වාදුන් සමානුපාතික සංකල්පයට කලාපය තුල හා ගෝලීය වශයෙන් වැඩි අවදානයක් යොමුව ඇත (Restoy, 2019).

### නියාමනයේදී සමානුපාතිකත්වය හඳුන්වාදීම

සමානුපාතිකත්වය යනු, යම් කිසි නීතියක් හෝ රීතියක් හඳුන්වාදීමේදී එම නීතිය හඳුන්වාදීමෙන් බලාපොරොත්තුවන ප්‍රතිඵලය ට සමපාත වන පරිදි අදාළ නීතිරීති වල ස්වභාවය තද හෝ ලිහිල් කල හැකිය යන පොදු නීතියේ එන මූලික සංකල්පයකි. සරළව කියතොත්, මෙම සමානුපාතිකත්වය මගින් ගම්‍ය වන අදහස වනුයේ අවදානම වැඩි තැන්හිදී නීති දැඩි කලයුතු බව ද, අඩු අවදානම් සඳහා නීති ලිහිල් කල යුතු බවද යන්නයි. මෙම සිද්ධාන්තය මූල්‍ය නියාමන නීති රීතීන් සකස් කිරීමේදී අදාළ මූල්‍යායතනයන් විසින් මූල්‍ය පද්ධතිය වෙත ඇති කරන්නාවූ අවදානම සැලකිල්ලට ගනිමින් ඒ ඒ මූල්‍යායතන වෙත අදාළ වන නියාමන අවශ්‍යතා අඩු වැඩි කිරීම සඳහා පාදක කරගත හැක. මෙහිදී  වැඩි පද්ධතිමය අවදානමක් ඇති කරනු ලබන මූල්‍යායතන වැඩි බැරෑරුමකින් යුතුව සලකා දැඩි නීතිරීති හා නියාමන රෙගුලාසීන්ට යටත්කෙරෙන අතර, සාපේක්ෂව සරල මූල්‍යායතන වෙත දැඩි නියාමන රෙගුලාසීන් පැනවීමක් සිදුනොවේ.

මූල්‍ය ක්ෂේත්‍රයේ නියාමකයන්ගේ මූලික අභිප්‍රායයන් ලෙස මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථාවරත්වය ආරක්ෂාකිරීම, මූල්‍ය වෙළඳපොළ අඛණ්ඩතාවය තහවුරුකිරීම, පාරිභෝගික ආරක්ෂණය සහ මූල්‍ය අන්තර්ග්‍රහණය ප්‍රවර්ධනය හැඳින්විය හැකි අතර සමානුපාතක නියාමනය තුලින් මෙකී අභිලාෂයන් සාක්ෂාත් කරගැනීම සඳහා මූලික අඩිතාලමක් සැපයෙනු ඇත. මෙහිදී සමානුපාතික නියාමන තුලින් වෙළඳපොළ තරගකරුවන්ට සම අවස්ථා සැලසෙන අයුරින් සාධාරන ලෙස නීතිරීති හා රෙගුලාසි ක්‍රියාවට නැංවෙනු ඇති අතර මෙම නීතිරීති හා රෙගුලාසි මගින් වෙළඳපොළ වර්ධනයට බාධා නොවනු ඇති අතර මූල්‍ය වෙළඳපොළ තරගකාරීත්වය සහ සහභාගීවන්නන්ගේ විවිධත්වය සීමා කිරීමක් ද සිදු නොවනු ඇත. එමෙන්ම මෙමගින් විභේදිත නියාමන තන්ත්‍රයක් හඳුන්වාදීමට මගපාදනු ඇති අතර විභේදිත නියාමන තන්ත්‍රයක් මගින් මූල්‍ය ක්ෂේත්‍රයේ පවතින ආයතනයන්ගේ ව්‍යාපාර ආකෘතීන්ගේ ඇති වෙනස්කම්, සංවර්ධන බැංකුකරණය, ගෙවීම් බැංකු, ඩිජිටල් බැංකු මූල්‍ය අන්තර්ග්‍රහණය හෝ ග්‍රාමීය බැංකුකරණය ප්‍රවර්ධනය කිරීම වැනි විවිධ අභිරුචීන් ගේ ඇති වෙනස්කම් පිළිගැනීම සිදුවෙනු ඇත.

මූල්‍ය නියාමනය සඳහා සමානුපාතිකතාව යොදාගැනීම මූල්‍ය අධීක්ෂණය සඳහා සමානුපාත ක්‍රමය යොදා ගැනීමෙන් වෙනස් වන අතර මින් දෙවැන්න අවදානම මත පදනම්වූ අධීක්ෂණය ලෙස සාමාන්‍යයෙන් හැඳින්වේ. අවදානම මත පදනම්වූ අධීක්ෂණයේදී නියාමන ආයතන විසින් තමන් අධීක්ෂණය කරනු ලබන මූල්‍යායතනයේ අවදානම් ව්‍යුහය සළකා බලමින් ඒ සඳහා වෙන්කරනු ලබන සම්පත් ප්‍රමාණ ප්‍රශස්ථ (optimize) කරන අතර, මූල්‍ය නියාමනයේදී සමානුපාතිකතාවය ගෙන ඒමෙන් අදහස් කරනු ලබන්නේ ඒ ඒ මූල්‍යායතන වල නියාමන පිරිවැය ප්‍රශස්ථ කිරීමයි. මෙසේ සමානුපාතිකතාවය නියාමනයේ දී හා අධීක්ෂණ ක්‍රියාවලියේදී යෙදවීමේ වෙනස්කම් පැවතියද එම දෙඅංශයේම අවසන් ඉලක්කය වනුයේ ඉහළ සම්පත් ක්ෂමතාවයකින් යුක්තව මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායීතාව සුරැකීමට දායක වීම වේ (Restoy, 2018).

බැංකු වල ව්‍යාපාර ආකෘතීන් ට අනුගාමීව නියාමන රෙගුලාසි සකස්කිරීම වෙනුවෙන් මූලිකවම ඇති පසුබිම වනුයේ නියාමන රෙගුලාසි විසින් බැංකුවල තැන්පතු භාරගැනීම හා ණය දීමෙන් ඔබ්බට ඇති පුළුල් භූමිකාව තේරුම් ගත යුතුය යන තර්කය වේ. විශේෂයෙන් දියුණුවන රටවල වෙනත් විකල්ප මාධ්‍යයන් එතරම් පුළුල්ව නොපවතින පසුබිමක මූල්‍ය අන්තර්ගතකරණය ප්‍රචලිත කිරීම, අරමුදල් සම්පාදනය සඳහා මංපෙත් විවර කිරීම ආදී නොයෙකුත් සංවර්ධන ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා බැංකුවෙත පැවරෙන කාර්යයභාරය ඉමහත් වේ. මෙවැනි පසුබිමක, කුඩා හා ප්‍රදේශිය මට්ටමේ බැංකු විසින් ග්‍රාමීය ප්‍රජාවන්, කුඩා ව්‍යාපාර හා ගෘහ ඒකකයන් හට

අත්වැල් සපයමින් සංවර්ධයේ නියමුවෙක් ලෙස ද භාරධූර කාර්යයක් ඉටුකරනු ලබයි. එමෙන්ම නැගී එන ආර්ථිකයන් (emerging markets) තුල ගෙවුම් බැංකු (payment banks) වැනි සකසුරු නව්‍යතා[1] හරහා අන්තර්ජාල බැංකුකරණය සහ මුදල් රහිත ගෙවීම් වැනි පහසුකම් බහුතර පිරිසක් වෙත ප්‍රවර්ධනය කිරීමේ හැකියාව ද පවතී. මෙහිදී ඒ ඒ බැංකුවල ව්‍යාපාර ආකෘති පිළිබඳ සැළකීමක් නොකොට මුළු බැංකු ක්ෂේත්‍රයටම එකසේ බලපැවැත්වෙන නියාමන රෙගුලාසි පැනවීම තුලින් විවිධ ස්ථරයන් තුල විවිධ පරිමාණයේ බැංකු විසින් සිදුකරනු ලබන විවිධ භූමිකා සිදුකල නොහැකි තරමින් පිරිවැය අධික වනු ඇත.

මෙයට අමතරව, කුඩා බැංකු සඳහා නිසි සාධාරණීකරනයකින් තොරව පනවනු ලබන අධික නියාමන රෙගුලාසි මඟින් ඒවායේ තරඟකාරීත්වයට බාධා ඇතිකරන අතර සැමට සම අවස්ථා/ඉඩකඩ සැපයීමට (level playing) ඇති අයිතියට බාධා එල්ල වනු ඇත. මෙය ගනුදෙනුකරුවන්ගේ අභිරුචීන් හා යානොවීමක් ද වේ. එමෙන්ම, "අසමානුපාතික" නියාමන තන්ත්‍රයක් තුල අධික නිය ාමන පිරිවැය දරාගැනීම සඳහා කුඩා ප්‍රමාණයේ බැංකු හට ඒකාබද්ධ වීමට කටයුතු යෙදෙන අතර මෙවැනි කේන්ද්‍රකතාවන් හා විවිධාංගීකරණයෙන් තොර වීම් මූල්‍ය ක්ෂේත්‍රයේ ස්ථායීතාවට ද බලපෑම් කරනු ඇත.

මේ නිසා සමානුපාතිකත්වය මත පදනම් වූ විභේදිත නියාමන තන්ත්‍රයක් ක්‍රියාත්මක කිරීම වෙළඳපොළ සහභාගීවන නියාමකයින්, මූල්‍යායතන සහ ගනුදෙනුකරුවන් යන සියළු පාර්ශවයන්ගේ අභිරුචීන් හා යාවන්නක් වේ. යුරෝපා සංගමය, හොංකොං, ජපානය, ස්විට්සර්ලන්තය සහ ඇමරිකා එක්සත් ජනපදය වැනි ලොව පුරා නියාමන පාලන තන්ත්‍ර රැසක බැංකු නියාමන සැකසීමේදී හා ක්‍රියාත්මක කරවීමේදී මෙම සමානුපාතික ක්‍රමයේ මෙවලම් උපයෝජනය කර ඇත.

## බැංකු නියාමන සඳහා සමානුපාතික මූලධර්ම යොදා ගැනීම පිළිබඳ ගෝලීය නිදසුන්

ලොව පුරා නියාමකයන් විසින් නියාමන රෙගුලාසි සකස් කිරීමේදී සමානුපාතික මූලධර්ම විවිධාකාරයෙන් යොදාගන්නා නමුත් ඒවා ක්‍රියාත්මක කිරීමේදී අනුගමනය කරන පදනම මත ප්‍රධාන ආකාර දෙකකට වෙන් කර හඳුනාගත හැකි වේ. එනම්; සමානුපාතිකතාව සඳහා වර්ගීකරණ ප්‍රවේශය (Categorisation Approach for Proportionality - CAP) සහ සමානුපාතිකතාව සඳහා නිශ්චිත සම්මත ප්‍රවේශය (Specific Standard Approach for Proportionality - SSAP) වේ (Carvalho, et al., 2017).

වර්ගීකරණ ප්‍රවේශය යොදාගන්නා නියාමන තන්ත්‍ර තුලදී නියාමකයන් විසින් විවිධ ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංරචක මත පදනම් ව බැංකු විවිධ කොටස් වලට වර්ගීකරණය කරනු ලබන අතර ඒ ඒ වර්ගීකරණයට අයත් බැංකු සඳහා වෙන් වෙන් වශයෙන් නියාමනයන් බල පැවැත්වෙනු ඇත.

නිශ්චිත සම්මත ප්‍රවේශය අනුගමනය කරන නියාමන තන්ත්‍රයන් හිදී නියාමකයන් විසින් විචක්ෂණ නියාමනයන්ගේ උපකුලකයකට; එනම්, අනාවරන කිරීම්, ද්‍රවශීලතා අනුපාත, විශාල නිරාවරණ සීමාවන් හා වෙළඳපොළ අවදානම් වැනි නිශ්චිත නියාමන අවශ්‍යතා සමානුපාතිකව ක්‍රියාත්මක කිරීම සඳහා නිශ්චිත නිර්ණායකයන් ස්ථාපනය කර ඇත.

කෙසේ නමුත්, මෙම නියාමන ක්‍රියාත්මක කරවීමේ ප්‍රවේශ දෙකෙහි විවිධ වෙනස්කම් පැවතුන ද එම දෙආකාරයේදීම බැංකු වල ප්‍රමාණය සැලකිල්ලට ගැනීම පොදු සාධකයක් ලෙස දැක්විය හැක. එමෙන්ම, මෙම ආකාර දෙකට ම ඒ ඒ ක්‍රමවේදයට ආවේනික සාධනීය ගුණයන් පවතී.

උදාහරණයක් ලෙස, වර්ගීකරණ ප්‍රවේශය මඟින් යම් නියාමන තන්ත්‍රයක් තුල ඇති සමාන ගති ලක්ෂණ සහිත බැංකු සියල්ලට ම සමව විචක්ෂණ නියාමන ක්‍රියාත්මක කරවීම සිදුවේ. මෙමඟින් නියාමකයන්ට සිය නියාමන රාමුවන් ඒ ඒ බැංකු කාණ්ඩ සඳහා අදාළ වන අධීක්ෂණ ප්‍රවේශයන් හා නිරාකරණ උපායමාර්ගයන් හා ඒකාංග කරවීමට අවස්ථාව ලැබෙන අතර ඒ හරහා ඒ ඒ කාණ්ඩයේ බැංකු වෙත අදාළ වන නියාමන ප්‍රතිපත්ති රාමු සමානව ක්‍රියාත්මක කරවීමට අවස්ථාව එළඹෙනු ඇත. අනෙක් අතට, නිශ්චිත සම්මත ප්‍රවේශය හරහා ඒ ඒ බැංකු වල ව්‍යාපාර ආකෘතිය හා සමස්ථ අවදානම් ව්‍යුහය සැලකිල්ලට ගනිමින් ඒ ඒ බැංකුවල නෛසර්ගික ගති ලක්ෂණයන්ට වඩාත් උචිත වන පරිද්දෙන් නියාමන අවශ්‍යතා ඉතා සියුම් මට්ටමේ සිටම නිර්මාණය කිරීමට අවස්ථාව සලසා දේ. එමනිසා නිශ්චිත සම්මත ප්‍රවේශය තුලින් බැංකුවල ව්‍යාපාර කටයුතු සහ අවදානම් ව්‍යුහයට අදාලත්වයක් සහිත නිශ්චිත ප්‍රදේශයන් සැලකිල්ලට ගෙන වඩාත් ගැලපෙන නියාමනයන් ක්‍රියාත්මක කරවීමට අවස්ථාන ලබා දේ. මෙමඟින් විචක්ෂණ ප්‍රමිතීන් අනිසි ලෙස දුර්වල කිරීමකින් තොරව, අනවශ්‍ය නියාමන බර පමණක් ලිහිල් කිරීමට මඟ පාදනු ඇත.

වර්ගීකරණ ප්‍රවේශය මත පදනම් ව විභේදිත නියාමන තන්ත්‍රයන් සඳහා උදාහරණ ලෙස බ්‍රසීලය, ජපානය හා ස්විට්සර්ලන්තය දැක්විය හැක. බ්‍රසීලයේ මූල්‍ය පද්ධතිය ප්‍රමාණය, දේශ සීමා වලින් එතෙර සිදුකරන ක්‍රියාකාරකම් සහ අවදානම් ව්‍යුහය යන සංරචක සැලකිල්ලට ගනිමින් කොටස් පහකට බෙදා ඇත. ස්විට්සර්ලන්තය ද මුළු වත්කම් ප්‍රමාණය, කළමණාකරනය සඳහා උපයෝජිත වත්කම්, තැන්පතු රක්ෂණ ක්‍රමය තුල රක්ෂිත තැන්පතු ප්‍රමාණය

1 සකසුරු නව්‍යතා හෝ සකසුරු ඉංජිනේරුකරණය (Frugal innovation/frugal engineering) යනු යම් භාණ්ඩයක හෝ සේවාවක සංකීර්ණත්වය හා වියදම අඩු කිරීමේ ක්‍රියාවලියකි. මෙමඟින් බොහෝ විට සිදු වන්නේ දියුණුවෙමින් පවතින ආර්ථිකයන්ට දැරිය හැකි මිලකට භාණ්ඩයක් හෝ සේවාවක් සැපයීම සඳහා එහි පවතින අත්‍යාවශ්‍ය නොවන විශේෂාංග ඉවත්කර ඉදිරිපත් කිරීමයි.

සහ අවශ්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය යන නිර්ණායක මත පදනම් වූ පස් වැදෑරුම් වර්ගීකරණයක් අනුගමනය කරයි. ජපානය විසින් සිය මූල්‍ය පද්ධතිය අන්තර්ජාතික වශයෙන් සක්‍රිය බැංකු සහ අන්තර්ජාතිකව සක්‍රිය නොමැති බැංකු ලෙස දෙආකාරයකට වෙන් කරන අතර මින් පළමුවැන්න සඳහා පූර්ණ වශයෙන් බාසල් ප්‍රමිතීන් හා අනුගත වීමට අපේක්ෂිත අතර දෙවැනි වර්ගය සඳහා දේශීය නියාමන රෙගුලාසීන් හා අනුකූල වීම අපේක්ෂා කෙරේ.

යුරෝපා සංගමය නිශ්චිත සම්මත ප්‍රවේශය ක්‍රියාත්මක කරන නියාමන තන්ත්‍රයන් ට උදාහරණයක් ලෙස දැක්විය හැකි අතර යුරෝපා සංගමය මගින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන සඳහා වෙළඳපොළ අවදානම සහ අනාවරණ අවශ්‍යතාවන් සම්බන්ධයෙන් ඇති නියාමන රෙගුලාසීන් සමානුපාතික පදනමින් ලිහිල් කිරීම හෝ නිදහස් කිරීම කර ඇත. මෙලෙසම, ඇමරිකා එක්සත් ජනපදය විසින් ද්‍රවශීලතා අවශ්‍යතා, වෙළඳපොළ අවදානම් සහ ආතති පරීක්ෂා වැනි විෂය පථයන් වල නියාමනයන් සමානුපාතිකව ක්‍රියාත්මක කරනු ලබයි. හොංකොං හිදී ණය අවදානම, ද්‍රවශීලතා අවශ්‍යතා සහ විශාල නිරාවරණ වැනි කාරණා වලට ව්‍යතිරේඛ සපයනු ලබයි.

කෙසේ නමුත් ලෝකයේ අනෙකුත් බොහෝ රටවල හා නියාමන තන්ත්‍රයන් තුල සමානුපාතික නියාමනයන් වර්ගීකරණ ප්‍රවේශය සහ නිශ්චිත සම්මත ප්‍රවේශය යන දෙවිධියන්ගේ ම සම්මිශ්‍රණයක් ලෙස ක්‍රියාත්මක කරන අතර දේශීය වශයෙන් ගත් කල, ශ්‍රී ලංකාව තුලද ඉහත දෙආකාරයේම මූලිකාංග වලින් සමන්විත සමානුපාතිකතාවක් බැංකු නියාමනය සඳහා යොදාගැනීමට ඇති හැකියාව සොයා බලමින් පවතී.

## ශ්‍රී ලංකාව තුල බැංකු නියාමන සඳහා සමානුපාතිකතාව හඳුන්වාදීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය වශයෙන් පද්ධතිමය වැදගත්කමක් ඇති බැංකු (දේ.ප.වැ.බැ.) හා කටයුතු කිරීම සම්බන්ධ ක්‍රියාපටිපාටියක් අන්තර්ජාතික කාල රාමුව හා යමින් මෑතක දී එළි දැක්වූ අතර එමගින් අදාළ බැංකු සඳහා පමණක් අදාළ වන ඉහළ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතා සහ අවදානම් කළමනාකරණය හා අභ්‍යන්තර පාලන විධික්‍රම යන අංශයන් ගෙන් බලාපොරොත්තු වන ඉහල නියාමන අපේක්ෂණ පිළිබඳ දැනුම් දෙන ලදී. එමෙන්ම, මෙලෙස දේ.ප.වැ.බැ. විධිමත් ලෙස වෙන් කර හඳුනා ගැනීම මගින් මෙරට බැංකු ක්ෂේත්‍රය දේ.ප.වැ.බැ. හා දේ.ප.වැ.බැ. නොවන වශයෙන් ප්‍රධාන කොටස් දෙකකට කාණ්ඩ කර හඳුනාගැනෙන අතර, දේ.ප.වැ.බැ. සඳහා තීව්‍ර ලෙස අධීක්ෂණ කටයුතු හා පුළුල් නියාමනයන් බල පැවැත්වෙන අතර දේ.ප.වැ.බැ. නොවන බැංකු සඳහා සමානුපාතිකත්වය පදනම් කරගත් වෙනස් වූ ක්‍රියා පිළිවෙතක් අනුගමනය කෙරේ.

ඉදිරි කාලය තුල, ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ නියාමන ක්‍රියාවලිය සමානුපාතික සංකල්පය මත පදනම් වූ මූලාංගයන් සමඟින් බොහෝ ලෙස හැඩ ගැස්වෙනු ඇති අතර, ඉදිරියේදී පැමිණීමට නියමිත නව බැංකු පනත තුල ශ්‍රී ලංකා මහ බැංකුවට විභේදිත නියාමන රාමුවක් ක්‍රියාවට නැංවීම සඳහා නම්‍යශීලී වීමට අවශ්‍ය පසුබිම සලසන විධිවිධාන ඇතුලත් වනු ඇත. මෙම විභේදිත හෝ සමානුපාතික නියාමනයන් සඳහා කේන්ද්‍ර කරගන්නා විෂය කරුණු අතරට ප්‍රාග්ධන හා ද්‍රවශීලතා අවශ්‍යතා, විශාල නිරාවරණ, වෙළඳපොළ අවදානම, ප්‍රාග්ධන සැලසුම් සහ අධීක්ෂණ සමාලොචන, අනාවරණ අවශ්‍යතා සහ ප්‍රතිසාධන හා නිරාකරණ සැලසුම් ක්‍රියාත්මක කරවීම ඇතුලත්වේ. සමානුපාතිකත්වය වෙත නියාමන රාමුවේ සිදුවන මෙම සංක්‍රාන්තියට පරිපූරකව බලතුලාභී බැංකු අවදානම මත පදනම් වූ අධීක්ෂණ ක්‍රියාවලිය හරහා ද සවිමත් වනු ඇත.

## අභියෝග හා ඉදිරි දැක්ම

නියාමන සඳහා සමානුපාතිකත්වය ක්‍රියාවට නැංවීමේ දී මුහුණ පෑමට සිදුවන ප්‍රධානම අභියෝගය වනුයේ බැංකු වෙත ඇති නියාමන බර ලිහිල් කරන අතර වාරයේ විචක්ෂණශීලී නියාමන අධීක්ෂණය සමබරව පවත්වාගැනීමයි. එම නිසා නියාමන අවශ්‍යතාවයන් ලිහිල් කල හැකි වනුයේ එසේ ලිහිල් කල නියාමනයන් විසින් අදාල බැංකු වල ද්‍රවශීලතාව, නුබුන්වත්භාවය හා දිගු කාලීන තිරසාරත්වය තහවුරු කර තැබිය හැකි නම් පමණි. මේ සම්බන්ධයෙන් නියාමන ලිහිල් කිරීම නිසා ලැබෙන සහනය මත ප්‍රාග්ධන සංරක්ෂක ඉහළ දැමීමට ඇති හැකියාව හෝ ප්‍රාග්ධන සංරක්ෂක ඉහළ මට්ටමක පවත්වාගන්නේ නම් නියාමනයන් ලිහිල් කිරීමට ඇති හැකියාව යනාදී විකල්ප සලකා බැලිය හැක. තවද, නියාමනයන් ලිහිල් කිරීම නිසා බලපතුලාභී බැංකුවෙත ලැබෙන පිරිවැය ඉතිරිය හා ප්‍රාග්ධන නිදහස් වීම් නිසා ඇතිවන වාසියේ ප්‍රතිලාභ රටේ ආර්ථිකයේ වැඩි පරාසයක පාර්ශවකරුවන්ට ලැබෙන සේ කටයුතු කිරීමට බලපතුලාභී බැංකු හට සදාචාරාත්මක වගකීමක් පැවරෙනු ඇත. එමෙන්ම මෙම සමානුපාතික නියාමන තන්ත්‍රය අවභාවිතයට ගැනීම වැලැක්වීමට සහ වෙළඳපොළ මගින් උත්තේජිත, කාර්යක්ෂමතා වර්ධනය ඉලක්කගතව සිදුවන කුඩා බැංකු ඒකාබද්ධ වීම් වැලැක්වීමට හෝ දේශීය බැංකු ව්‍යාප්ත වීමට හා මෙරට දේශ සීමාවෙන් ඔබ්බට ඇති කලාපීය ඉඩ ප්‍රස්ථා සොයාබැලීම වැලැක්වීමට හේතු කාරකයක් නොවීමට නියාමකයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වගබලා ගත යුතුවේ.


මූලාශ්‍ර

Carvalho, A. P. C., Hohl, S., Raskopf, R. & Ruhnau, S., (2017) *Proportionality in banking regulation: a cross-country comparison.* FSI Insights on policy implementation. Basel: Financial Stability Institute, p.13-20.

Restoy, F., (2018) *Proportionality in banking regulation. London, Bank for International Settlements.*

Restoy, F., (2019) *Proportionality in financial regulation: where do we go from here. Basel, Bank for International Settlements.*